# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

# දකුණු පළාත

## දකුණු පළාතේ ලියාපදිංචි සමුපකාර සමිතිවල මුදල් තැන්පත් කරන සියලු පාර්ශවයන් වෙත කෙරෙන විශේෂ දැනුම්දීම

සාමාජිකයින් අයිතිකරුවන් වන සමුපකාර සමිති, 1983 අංක 32 හා 1992 අංක 11 යන පනත් වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පණත යටතේ ලියා පදිංචි වී ඇති බැවින් නෛතික පුද්ගල භාවයක් ඇත. විවිධ සේවා සමුපකාර සමිතිවලට ග්‍රාමීය බැංකු නාමය භාවිතා කිරීමට අවසර දී තිබුනද ලියාපදිංචි කිරීමේදී බැංකුව යන්න ඇතුලත් කර ඇති සමිති හැර ,දකුණු පළාත තුළ විවිධ නම් වලින් ඇති අනෙකුත් කිසිදු සමිතියක් සඳහා බැංකු නාමය භාවිත කිරීම නිවැරදි නොවේ.

දකුණු පළාතේ ලියාපදිංචි සමුපකාර සමිති බවට ප්‍රචාරණය කරමින් තැන්පත් රැස්කරන ආයතන මෙන්ම දෙපාර්තමේන්තු නියාමන ක්‍රියාවලියට අනුගත නොවන සමුපකාර සමිති පැවතිය හැකි බැවින් විශේෂයෙන් සාමාජික නොවන අයෙකු සමුපකාර සමිතියක මුදල් තැන්පත් කිරීමේදී එම සමිතිය ලියා පදිංචි සමුපකාර සමිතියක්ද යන්න හා එම සමිතියේ මූල්‍ය තත්ත්වය ,අවසන් වරට විගණිත වර්ෂය හා ඒ සම්බන්ධයෙන් තොරතුරු තහවුරු කරගෙන තම තැන්පත් කටයුතු සිදුකරන ලෙස මෙයින් දැනුවත් කරමි.

සමිති මගින් ස්ථාවර තැන්පත් හා ඉතුරුම් තැන්පත් පොලී අනුපාත නියම කිරීමේදී මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරනු ලබන මූල්‍යමය උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඊට අනුගතව තැන්පත් භාර ගැනීමේදී පොලී අනුපාත නියම කරන ලෙස සියලුම ලියා පදිංචි සමිති වෙත උපදෙස් ලබා දී ඇත.

දකුණු පළාතේ සමුපකාර සමිතිවල තැන්පත් කිරීම් සිදු කිරීමේදී (විශේෂයෙන් මහා පරිමාණ මුදල් තැන්පත් කිරීම් වලදී) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පහත දුරකථන අංක මගින් ඔබගේ අවශ්‍යතාවය මත අදාල සමිති පිළිබඳ තොරතුරු විමසා වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

| | | |
|---|---|---|
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (සංවර්ධන) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,නො 147/3,පෙට්ටිගල වත්ත,ගාල්ල | 091-2226554 |
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය,පෙට්ටිගල වත්ත,ගාල්ල | 091-2234308 |
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය,පීක්වැල්ල,මාතර | 041-2222329 |
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය, සිරිබෝපුර,හම්බන්තොට | 047-2256015 |

**සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්,**
**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(දකුණු පළාත),**
**නො 147/3,පෙට්ටිගල වත්ත,ගාල්ල.**

**දු.අං.** : 091-2234380
**ෆැක්ස්** : 091-2232291
**විද්‍යුත් තැපෑල** : southerncoopdcd@gmail.com